# <u>සියළුම නේවාසික විද්‍යාර්ථීන් වෙත කෙරෙන විශේෂ නිවේදනයයි</u>

- රාත්‍රී 8.00 ට ප්‍රථම තම නේවාසිකාගාරය වෙත පැමිණීම අනිවාර්ය වේ. (පස්වරු 6.00ට ප්‍රථම තම නේවාසිකාගාරය වෙත පැමිණීම අපේක්ෂා කරනු ලැබේ.)

- යම්කිසි විද්‍යාර්ථියකු රාත්‍රී 8.00 පසුවී නේවාසිකාගාරයට පැමිණීමට අපේක්ෂා කරයිනම් ඒ බව කල් ඇතිව නේවාසිකාගාර උපශාලාධිපති වෙත වාර්තා කල යුතුය.

- නේවාසිකාගාරය තුලට අමුත්තන් ගෙන්වා ගැනිම හැකි තාක් සිමාකල යුතු අතර එවැනි අවස්ථාවක නිසි අවසරය මත අමුත්තතන් ගෙන්වා ගත යුතු අතර පස්වරු 5.00ට පෙර අමුත්තන් නේවාසිකාගාරයෙන් බැහැර විය යුතුය.

- රාත්‍රී 8.00 පසුවී පැමිණෙන විද්‍යාර්ථීන් නේවාසිකාගාර වෙත පැමිණීමේදී ආරක්ෂක නිලධාරීන් විසින් ඒ බව අදාළ උප ශාලාධිපති වෙත දුරකථන මාර්ගයෙන් දැනුවත් කරනු ලබන අතර නේවාසිකාගාරය විවෘතකල පසුව එම සිසුන් නේවාසිකාගාරය වෙත යොමු කරනු ඇත. එහිදී සුළු ප්‍රමාදයක් ඇති විය හැකි අතර ඒ අවස්ථාවන්හි ඉවසීමෙන් හා සංයමයෙන් යුතුව කටයුතු කිරිම අපේක්ෂා කෙරේ.

- සවස 6.00න් පසුව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ හා ඉන් පිටත ගමන් බිමන් හැකිතාක් සීමා කරන ලෙස සියලුම සිසුන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

- නේවාසිකාගාරයෙන් උදෑසන 6.00ට පෙර බැහැර විමට අවශ්‍ය නම් නේවාසිකාගාර උපශාලාධිපති සහ ආරක්ෂක අංශ දැනුවත් කිරිමට කටයුතු කරන්න.

- රාත්‍රි කාලයේ විදුලිය විසන්ධි වී ඇති විට නේවාසිකාගාරයෙන් පිටවීම නොකළ යුතුය.

- තම නේවාසිකාගාර කාමරයෙහි ජනෙල් හා දෙරවල්වල අගුළු නිසි ලෙස ක්‍රියාත්මක වේ දැයි පරීක්‍ෂා කළ යුතු අතර නින්දට යාමට ප්‍රථම ඒවා නිසි පරිදි අගුළුළෑම අනිවාර්ය වේ. එම අගුළුවල යම්කිසි දොෂයක් වෙතොත් ඒ බව නේවාසිකාගාර උපශාලාධිපති වෙත දැනුවත් කළ යුතුය.

- මිල අධික ආභරණ හා අනෙකුත් දෑ නේවාසිකාගාර තුළ භාවිතය හැකිතාක් සීමා කළ යුතු අතර අත්‍යවශ්‍ය එවැනි මෙවලම් (ජංගම දුරකථන, ලැප්ටොප් පරිගණක ආදිය) හැකිතාක් ආරක්ෂිත ලෙස නේවාසිකාගාර කාමර තුළ ස්ථානගත කිරීමට වගබලා ගත යුතුය.

- මෙකී සියලුම පියවරයන් ගෙන ඇත්තේ ඔබගේ ආරක්ෂාව මත පදනම්ව පමණක් බව දැනුම් දීමට කැමැත්තෙමු.

- නේවාසිකාගාර පරිශ්‍රය තුල හෝ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල සැත කටයුතු පුද්ගලයෙකු දුටුවහොත් වහාම ආරක්ෂක අංශය වෙත දැනුම් දෙන්න.

**0112 903143 / 0112 903144 / 0112 903462**

ශිෂ්‍ය සේවා අංශය
2022.08.03